**සොබා දම් අනතුරු**

# ඇට්නා ගිනිකන්දට පණ එයි



ඇට්නා ගිනිකොණ දිග ප්‍රදේශයෙන් ලාවා, අළු හා දුම් ගලා ගිය අයුරු

ඉතාලියේ සිසිලි දූපතේ පිහිටි ඇට්නා යමහල (ගිනිකන්ද) පිපිරී යාමේ අවදානම නැවතත් ඇතිව තිබේ. ඇට්නාවලින් නිකුත් වූ ලාවා හා අළු දූත් කැටනියා නගරයට වැටෙන්නට පටන්ගෙන ඇත. යුරෝපයේ පවතින වඩාත් ම විශාලතම සක්‍රිය ගිනිකන්ද ඇට්නා ය.

කෙසේ වෙතත් තවමත් කන්ද අවට ප්‍රදේශවල ජනයාට ලොකු අනතුරකට මුහුණ දෙන්නට සිදුවී නැත. හදිසියේ කඩා වැටෙන දියරවලින් ගැලවීම සඳහා කුඩ ඉහළාගෙන යන ප්‍රදේශවාසීන් නම් මේ දිනවල දී දක ගත හැකි ය.

ඇට්නාවල මීට පෙර ආසන්න ම පිපිරීම සිදුවූවේ 1991 දී ය. මෑත දී ඇතිවූ සියලුම ලාවා විදරණයන් සිදුවූවේ 1971 දී හටගත් නව ගිනිකොණ දිග ආවාටය හරහා ය. ගිනිකන්ද වටා මීටර 3300 ක ප්‍රදේශයකට නිකුත් වී ඇති අතර ප්‍රබල ලෙස ලාවා නිකුත් වී ඇත්තේ බෝව් නිම්න ප්‍රදේශයේ මීටර 100 ක පමණ කොටසකට පමණි.



කැටානියා ප්‍රදේශයට ලාවා ගලා ඇවිත් තිබූ අයුරු



ඇට්නා ගිනි කන්ද මතට ගුවන්යානයකින් වතුර අමනා අයුරු

## භයානක ගිනිකඳු පිපිරීම්

ක්‍රි. ව. 79 – ඉතාලියේ විසූවියස් කන්ද පිපිරීමෙන් හර්කියුලේනම්, ස්ටේබියා හා පොම්පේ නගර වැනසී ගියේ ය. (නගරවල ජනගහනයෙන් 10% මිය ගියහ.)

1631 – විසූවියස් (මරණ 4000)

1669 – ඇට්නා – සිසිලිය (මරණ 30,000)

1783 – ලකි – අයිස්ලන්තය ( මරණ 10,000)

1792 – අන්සන් ඩේක් – ජපානය (මරණ 10,000)

1815 – ටැම්බොරෝ – ඉන්දුනීසියා ( මරණ 92,000)

1822 – ගලුන්ගන්ග් – ඉන්දුනීසියාව ( මරණ 4000)

1883 – ක්‍රැකටෝවා ඉන්දුනීසියාව (මරණ 36000)

මොන්ටන්නි පෙලී – සෙන්ට් පියරි (මරණ 30,000)

1911 – ටාල් – පිලිපීනය (මරණ – 3000)

1951 – ලැමින්ටන් – නවගිනියාව (මරණ 3000)

1963 – ගුන්නන් අගුන් – ඉන්දුනීසියාව (මරණ 1600)

1968 – එල් ආරනල් – කොස්ටාරිකා (මරණ 134)

1977 ජනවාරි – නයිරගොන්ගෝ – ෂයරේ (මරණ 2500)

1979 පෙබරවාරි – ඩීඉන්ග් – ඉන්දුනීසියාව (මරණ 182)

1981 මැයි – සෙමුරු කන්ද – ජාවා ඉන්දුනීසියාව (මරණ 378)

1982 සැප්තැම්බර් – ගලුන්ගුන්හ් – ඉන්දුනීසියාව (මරණ 104)

1985 නොවැම්බර් – නෙවාඩාඩෙල්රුයිස් – කොලොම්බියා (මරණ 25000)

1986 අගෝස්තු –ලේක්නියොස් අසල ප්‍රදේශය – කැමරූන් (මරණ 1746)

1991 ජූනි – අන්සන් කන්ද – ජපානය (මරණ 41)

1991 ජූනි – පිනටුබො කන්ද – පිලිපීනය (මරණ 600– ලාවා පැතිරීම නිසා වසංගත පැතිරිනි)

1995 සැප්තැම්බර් – පාර්ක් ගිනිකන්දේ (පිලිපීනයේ) ආවාටය දියවීමෙන් මරණ 70 ක් ඇති විය. 80 ක් අතුරුදහන් විය.

1997 ජූනි – සවුෆ්රිරි – මොන්ට්සෙර්ට් – (මරණ 19 – නගරයෙන් අඩක් ම විනාශ විය.)

ඒ ප්‍රදේශයේ කිසිවකු ජීවත් නොවන මුත් එය නිකොලොසි නගරයට ආසන්න නිසා රජය විසින් හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කර ඇත.

ගිනිකඳු විශේෂඥයන්ගේ අදහස වන්නේ බෝව් නිම්නයට වැටෙන ලාවා හේතුකොටගෙන ඇති වන පීඩනය නිසා වෙනත් ආවාට සක්‍රිය වන්නට ඉඩ ඇති බව ය. දෙවන ලාවා ප්‍රහාරය තිකුත්ව ඇත්තේ නිකොලොසි නගරයට කිලෝමීටර් 4 ක් පමණ ඈතින් වූ ප්‍රදේශයකිනි. පළමුව වේගවත්ව ඇද වැටුණ ලාවා ප්‍රහාරය පසුව අඩු වේගයකින් ගලා යන්නට පටන්ගෙන ඇත. එයට හේතුව සමතලා බිමක් ඔස්සේ එය ගලා යාම ය. 1892 හා 1910 දී සිදුවූ විදාරණයන් හි දී ගැලූ ලාවා මේ බිමේ තැන්පත්ව පවතී.

පරිගණක දත්ත ක්‍රම හරහා කළ පෙරයිම්වලින් පෙනී යන්නේ ලාවා දහරාව නිකොලොසි හරහා ගමන් ගැනීමට නියමිත බව ය. ඉතාලි භූ භෞතික විද්‍යා හා ගිනිකඳු අධ්‍යයන විද්‍යා ආයතනයේ ජියොවානි ෆැසෙටන්ට අනුව නම් මේ අවස්ථාවේ දී ගිනිකන්ද නිසා ලොකු අනතුරක් වීමට ඉඩ නැත.

සැබැවින් ම මේ වනතුරු ගිනිකන්ද හේතුකොට ජීවිත විනාශයක් වී නැත. අවුරුදු අඩ මිලියනයක් පමණ වයසැති ඇට්නා විශාලතම අනතුර කළේ 1669 දී ය. ඒ අවස්ථාවේදී 30,000 ක් දෙනා මරුමුවට පත් වූහ.

ඇට්නාහී පැතිරීම ගැන නිරීක්ෂණ කළ කැටනියාහි පොසෙයිඩොන්(Poseidon)ආයතනයේ කළමණාකාර අධ්‍යක්ෂ ලෙටරියෝ විලාරි කියන්නේ වෙනත් ගිනිකඳු මෙන් ඇට්නා ගිනිකන්දෙන් මිනිසුන්ට අනතුරක් නොවන බව ය. එය ක්ෂණිකව පිපිරී හානි නොකරයි. විවිධ ඉඟි මගින් පිපිරීම ගැන දැනුම් දෙයි. අනතුරක ඉඟියක් ලද වහා ම ඒ ගැන සන්නිවේදනය කළ හැකි වීම ඊට හේතුව යි.

විලාරිගේ සහයකයා වන සැල්වෝ ගැබ්බිනෝ මේ ගැන මෙසේ පැහැදිලි කරයි.

"අනතුරක සේයාවක් ලද වහා ම අපි මහජන ආරක්ෂක සේවා ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන් ම ආසන්න නගරසභාවලත් කැටනියා ගුවන් තොටුපළේත්."


ගිනිකන්දේ විදාරණය හේතුකොටගෙන ජීවිත හානි නොවුණත් ලාවා නිසා ගුවන්යානා ගමනාගමනයට වන හානිය නම් සුළුපටු නොවේ.

පසුගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ දී ගුවන් බසයක් ලාවාවල හැපීම නිසා යළි ෆොන්ටරෙස්සාවලට ගෙන ඒමට සිදු විය. කවුරුන් කෙසේ කීවත් ඇට්නා ඔවුන් කියනා තරම් අහිංසකයකු නොවේ. 1669 දී ජීවිත 30,000 ක් බිලි ගැනීමෙන් පසුව ද වරින්වර එය ජීවිත බිලි ගත්තේ ය. අවසන්වරට ඇට්නාට ගොදුරු වූවේ 1987 දී ඒ අසල ප්‍රදේශයේ ඇවිදින්නට ගිය සංචාරකයන් නම දෙනෙකි. මෙවැනිම දෙයක් ඊට අවුරුදු අටකට පෙර එනම් 1979 දී ද සිදු විය. ❑

## ඇට්නා ගිනිකන්දේ ලාවා ප්‍රවාහය

**ඇට්නා ගිනිකන්ද අසල ඇති ගම්මානයට පසුගියදා ගලා ආ ලාවා ප්‍රවාහය දැන් අඩුවෙමින් පවතින බව රොයිටර් පුවත් සේවය වාර්තා කරයි.**


### ඇට්නා වේ ඇතුළත





(වසර දහස් ගණනකට පෙර සිදුවූ ආවාට බිඳීයාමෙන් බිහිවූ තලාවකි)

### අනතුරේ ස්වභාවය

- ඇට්නා යුරෝපයේ සක්‍රියම හා විශාලම ගිනිකන්දය
- නිකොලොසි ගමේ ජනගහනය 5000 කි
- ලාවා ඇත්තේ නිකොලොසිවලට කි.මී. 4ක් දුරිනි. ජූලි අවසාන සතිය වන විට ලාවා ප්‍රවාහයේ වේගය අඩුවී තිබේ.
- බුල්ඩෝසර් මගින් ස්වභාවික බාධක (පස් හා පැරණි වියළි ලාවා තට්ටු උදව්කරගෙන) ඇතිකර තිබේ.




REUTERS